පුවත්පත් නිවේදනය

යොමුව-නාරා/පාලන/2023/02/RL/ටෙන්ඩර් අංක01

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

# ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනය,කාක දූපත , මට්ටක්කුලිය ,කොළඹ-15

ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනයේ (නාරා)කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරිම සඳහා ප්‍රසම්පාදන මණ්ඩලය විසින් මාසිකව ගෙවීමේ පදනම මත කුළී වාහන ලබා ගැනීම වෙනුවෙන් ලංසු ඉදිරිපත් කරන ලෙසට මෙයින් ආරාධනා කරමි . අදාළ වන්නාවූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛණය ලබා ගත හැක්කේ ආපසු නොගෙවන රු:1,000.00 ක මුදල් තැන්පතුවක් අධ්‍යක්ෂක ජනරාල්,නාරා වෙත තැන්පත් කිරිමෙන් පසුව මිලදී ගැනුම් හා සැපයුම් ඒකකය නාරා වෙතිනි.

01 . අවශ්‍ය කෙරෙන වාහන පංති , ගමන් මාර්ග හා අනෙකුත් පිරිවිතරයන් පහත දක්වා ඇත . කොන්ත්‍රාත් කාලය එක් වසරක් වේ.

| ප්‍රවාහන සේවාව | ගමන් මාර්ගය | එක් ගමන් මාර්ගයක දුර කි.මී | ආරම්භ කළ යුතු වේලාව හා ස්ථානය | ආපසු ගමන් කළ යුතු වේලාව හා ස්ථානය | පහසුකම් ලබන සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| මීගමුව-නාරා | මීගමුව බස් නැවතුම් පොළ ඉදිරිපිට සිට ජා-ඇල , කඳාන , මහබාගේ ,ගුණසේකර මාවත , කෙරවලපිටිය , හරහා ඇලකන්ද මට්ටක්කුලිය නව පාලම ඔස්සේ නාරා ප්‍රධාන කාර්යාලය සහ ආපසු එම මාර්ගයේම මීගමුව බස් නැවතුම්පොළ දක්වා . | කි . මී 32 | පෙ.ව 07.00 ට මීගමුව බස් නැවතුම් පොළ ඉදිරිපිට සිට | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන් | 34 |
| ජා-ඇල - නාරා | ජා-ඇල බස් නැවතුම් පොළ ඉදිරිපිට සිට , කඳාන , මහබාගේ ,ගුණසේකර මාවත , කෙරවලපිටිය, හරහා ඇලකන්ද මට්ටක්කුලිය නව පාලම ඔස්සේ නාරා ප්‍රධාන කාර්යාලය සහ ආපසු එම මාර්ගයේම ජා-ඇල බස් නැවතුම්පොළ දක්වා | කි . මී 14ග9 | පෙ.ව 07.30 ට ජා-ඇල බස් නැවතුම් පොළ ඉදිරිපිට සිට | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන් | 34 |
| කොට්ටාව-නාරා | කොට්ටාව වීරසිරි ස්ටෝර්ස් ඉදිරිපිට සිට අතුරිගිරිය පාර ඔස්සේ වල්ගම හන්දිය ,ඥානවිමළ මාවත,අතුරිගිරිය, අතුරිගිරිය පාර,මාළඹේ,කොස්වත්ත,අග්ගොන,වල්පොළ පාර,රෝහල පාර,අංගොඩ,ශ්‍රී සුමන මාවත ,කැළණිමුල්ල,කැළණි විහාරය,බියගම පාර,4 කණුව,නුවර පාර ,පැලියගොඩ වට රවුම,වික්ටෝරියා පාලම ,තොටළග, ෆර්ගියුසන් පාර , විස්ට්වයික් පාර,සී බීච් පාර , නාරා පාර ඔස්සේ නාරා ප්‍රධාන කාර්යාලය දක්වා හා ආපසු එම මාර්ගයේම කොට්ටාව වීරසිරි ස්ටෝර්ස් දක්වා | කි . මී 28 | පෙ.ව 06.55 ට කොට්ටාව වීරසිරි ස්ටෝර්ස් ඉදිරිපිට සිට | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන් | 12 |
| බොරැල්ල-නාරා | උදෑසන-<br>බොරැල්ල ළමා රෝහල ඉදිරිපිට සිට බේස්ලයින් පාර , දෙමටගොඩ , ඔරුගොඩවත්ත,කැළණිතිස්ස හරහා ඉඟුරුකඩේ හන්දිය , ඔරලෝසු කණුව , ජයන්ත මල්ලවආරච්චි මාවත ,මාදම්පිටිය හරහා ෆර්ගියුසන් පාර හරහා නාරා ප්‍රධාන කාර්යාලය<br>සවස-<br>නාරා ප්‍රධාන කාර්යාලය සිට ෆර්ගියුසන් පාර ,තොටළග, පැලියගොඩ,අළුත්පාලම හරහා බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත, දෙමටගොඩ, බොරැල්ල ළමා රෝහල ඉදිරිපිට | කි.මී 7<br>කි.මී 8 | පෙ.ව 07.45 ට බොරැල්ල සිට | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන් | 19 |
| නිට්ටඹුව-නාරා | නිට්ටඹුව බස් නැවතුම අසල සිට නුවර පාර,මිරිස්වත්ත හන්දිය ,නුවර පාර ඔස්සේ කඩවත , කිරිබත්ගොඩ , කැළණිය , පැලියගොඩ,තොටලග, අළුත්මාවත හරහා නාරා ප්‍රධාන කාර්යාලය සහ ආපසු එම | කි . මී 38 | පෙ.ව 06.40 ට නිට්ටඹුව බස් නැවතුම අසල සිට | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන් | 42 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මාර්ගයේම නිට්ටඹුව බස් නැවතුම දක්වා. | | | | |
| කළුතර-නාරා | උදෑසන-<br>කළුතර බස් නැවතුම ඉදිරිපිට සිට ගාලු පාර ඔස්සේ කොටුව දුම්රියපොළ ඉදිරිපිට මල්වත්ත පාරේ සිට අබ්දුල් කාදර් මාවත (රෙක්ලමේෂන් පාර)අලුත් මාවත පාර,විස්ට්වයික් පාර,සී බීච් පාර,නාරා පාර ඔස්සේ මට්ටක්කුලිය කාක දූපත නාරා ප්‍රධාන කාර්යාලය.<br><br>සවස-<br>නාරා ප්‍රධාන කාර්යාලයේ සිට නාරා පාර,සී බීච් පාර,විස්ට්වයික් පාර,අලුත්මාවත පාර,කේ සිරිල් සී පෙරේරා මාවත,බ්ලුමැන්ඩල් පාර,ආමර් විදිය,පංචිකාවත්ත,මරදාන දුම්රිය පොළ, ටෙක්නිකල් හන්දිය,පිටකොටුව හරහා ගාලු පාර ඔස්සේ කළුතර බස් නැවතුම දක්වා. | කි.මී 50.0 | පෙ.ව 06.20 ට කළුතර බස් නැවතුම ඉදිරිපිට සිට (මාර්ග තදබදය මත වේලාව සංශෝධනයට යටත් වේ)<br><br>කොටුව මල්වත්ත පාරට උදෑසන 08.05 වන විට පැමිණිය යුතුවේ. එම ස්ථානයෙන් පෙ.ව8.10 ට නාරා දක්වා ගමන් ආරම්භ කල යුතුය. | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන් | 39 |

**02**. ලංසුවේ වලංගු කාලය ලංසු භාර ගන්නා අවසාන දිනයේ සිට වැඩකරන දින 90 ක් එනම්, 2023 ජුලි මස 26 .තෙක් විය යුතුය.

**03. ලංසු ඉදිරිපත් කිරිමේදී එක් ප්‍රවාහන සේවාවක් සඳහා පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගත් රු:15,000.00 ක ලංසු සුරක්ෂණයක් හෝ අධ්‍යක්ෂක ජනරාල්/නාරා නමින් නාරා සරප් වෙත මුදල් ගෙවා එහි මුල් පිටපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය.**

**04.**ලංසු ඉදිරිපත් කිරිමේදී ආකෘතියේ කපා හෝ මකා හෝ වෙනයම් ආකාරයකින් හෝ වෙනසක් සිදු කරන්නේ නම් එම ස්ථානයන් හි ස්වකීය කෙටි අත්සන හා මුද්‍රාව යොදා එම වෙනස් කිරිම සහතික කළ යුතු අතර,එසේ නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ

**05.** එක් ප්‍රවාහන සේවාවක් සඳහා හෝ ප්‍රවාහන සේවා කීපයක් සඳහා හෝ ප්‍රවාහන සේවා සියල්ලම සඳහා හෝ ලංසු ඉදිරිපත් කළ හැකිය. එක් ලංසු ආකෘතියක් මගින් ලංසු ඉදිරිපත් කළ හැක්කේ එක් ප්‍රවාහන සේවාවක් සඳහා පමණි.

**06. අදාළ වන්නා වූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛණය නිකුත් කරනු ලබන්නේ 2023 පෙබරවාරි මස 23 සිට 2023 මාර්තු මස 14 වන දින දක්වා පමණි.මේ සම්බන්ධ පූර්ව ප්‍රසම්පාදන රැස්වීම 2023 මාර්තු මස 08 දින පෙ.ව 10.00 ට නාරා ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.**

**07.මුද්‍රා තබන ලද ඔබගේ ලංසුව 2023 මාර්තු මස 15 වන දින ප.ව 01.00 ට පෙර □□සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ජාතික ජලජ සම්පත් පර්යේෂන සහ සංවර්ධන නියෝජිතායතනනය, කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ-15 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටා ඇති මුදල් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටි අංක-03 ට බහාලීමෙන් හෝ ඉදිරිපත් කළ හැකිය.**

**ලංසු බහාලන කවරය මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතු අතර,එම කවරයේ වම්පස ඉහළ කෙළවර "නාරා කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා සඳහා මිළ ගණන් කැදවීම-2023/ටෙන්ඩර් පෙට්ටි අංක- 03" යනුවෙන් සඳහන් කළ යුතුය.**

**08. 2023 මාර්තු මස 15 දින ප.ව 01.00 ට ඉදිරිපත් වී ඇති ලංසු එදින එම වේලාවට ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනනයේ (නාරා) මුදල් අංශයේදී විවෘත කරනු ලබන අතර ,එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකුට සහභාගි විය හැකිය.**

**09.ප්‍රවාහන සේවා සපයනු ලබන බස් රථ නවතා තැබිමේ පහසුකම් නාරා ආයතනය විසින් නොමිලේ සපයනු ලැබේ.**

10.මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්,නාරා/මිලදී ගැනුම් හා සැපයුම් නිළධාරි මගින් ලබා ගත හැකිය.

11.ප්‍රසම්පාදන කමිටු තිරණය අවසන් තිරණය වේ.

සභාපති
ප්‍රසම්පාදක මණ්ඩලය
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත ,මට්ටක්කුලිය

කොළඹ15-
0112/529717/0112-521000

දිනය-2023 පෙබරවාරි මස 23